(නවවැනි පාර්ලිමේන්තුව - තෙවැනි සභාවාරය)

අංක **4**.]

# පාර්ලිමේන්තුවේ කාර්ය සටහන්

**2022 අගෝස්තු 12 සිකුරාදා පූ.භා. 10.00 ට**

## පැමිණි මන්ත්‍රීන් :

ගරු **මහින්ද යාපා අබේවර්ධන මහතා,** කථානායකතුමා

ගරු **අජිත් රාජපක්ෂ මහතා,** නියෝජ්‍ය කථානායකතුමා සහ කාරක සභා සභාපතිතුමා

ගරු **අංගජන් රාමනාදන් මහතා,** නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමා

---

ගරු **දිනේෂ් ගුණවර්ධන මහතා,** අග්‍රාමාත්‍යතුමා සහ රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමා

ගරු **මහින්ද අමරවීර මහතා,** කෘෂිකර්ම අමාත්‍යතුමා සහ වනජීවී හා වන සම්පත් සංරක්ෂණ අමාත්‍යතුමා

ගරු **ටිරාන් අලස් මහතා,** මහජන ආරක්ෂක අමාත්‍යතුමා

ගරු **නසීර් අහමඩ් මහතා,** පරිසර අමාත්‍යතුමා

ගරු **(ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා,** ප්‍රවාහන හා මහාමාර්ග අමාත්‍යතුමා සහ ජනමාධ්‍ය අමාත්‍යතුමා

ගරු **නිමල් සිරිපාල ද සිල්වා මහතා,** වරාය, නාවික හා ගුවන් සේවා අමාත්‍යතුමා

ගරු **ඩග්ලස් දේවානන්දා මහතා,** ධීවර අමාත්‍යතුමා

ගරු **මනූෂ නානායක්කාර මහතා,** කම්කරු සහ විදේශ රැකියා අමාත්‍යතුමා

ගරු **(වෛද්‍ය) රමේෂ් පතිරණ මහතා,** වැවිලි කර්මාන්ත අමාත්‍යතුමා සහ කර්මාන්ත අමාත්‍යතුමා

ගරු **(ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා,** අධ්‍යාපන අමාත්‍යතුමා සහ පාර්ලිමේන්තුවේ සභානායකතුමා

ගරු **ප්‍රසන්න රණතුංග මහතා,** නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යතුමා සහ ආණ්ඩු පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායකතුමා

ගරු **විදුර වික්‍රමනායක මහතා,** බුද්ධශාසන, ආගමික සහ සංස්කෘතික කටයුතු අමාත්‍යතුමා

ගරු **කංචන විජේසේකර මහතා,** විදුලිබල හා බලශක්ති අමාත්‍යතුමා

ගරු **එම්. යූ. එම්. අලි සබ්රි මහතා,** විදේශ කටයුතු අමාත්‍යතුමා

---

ගරු සෙල්වම් අඩෛක්කලනාදන් මහතා

ගරු ඒ. එල්. එම්. අතාඋල්ලා මහතා

ගරු තලතා අතුකෝරල මහත්මිය

ගරු සම්පත් අතුකෝරල මහතා

ගරු තිස්ස අත්තනායක මහතා

ගරු හෙක්ටර් අප්පුහාමි මහතා

ගරු රෝහිත අබේගුණවර්ධන මහතා

ගරු වජිර අබේවර්ධන මහතා

ගරු අශෝක් අබේසිංහ මහතා

ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා

ගරු මායාදුන්න චින්තක අමල් මහතා

ගරු (වෛද්‍ය) සීතා අරඹේපොල මහත්මිය

ගරු තවරාජා කලෛයි අරසන් මහතා

ගරු ලසන්ත අලගියවන්න මහතා

ගරු ජේ. සී. අලවතුවල මහතා

ගරු ඩලස් අලහප්පෙරුම මහතා

ගරු තිසකුට්ටි ආරච්චි මහතා

ගරු යූ. කේ. සුමිත් උඩුකුඹුර මහතා

ගරු එම්. උදයකුමාර් මහතා

ගරු (ආචාර්ය) මේජර් ප්‍රදීප් උඳුගොඩ මහතා

ගරු සංජීව එදිරිමාන්න මහතා

ගරු අකිල එල්ලාවල මහතා

ගරු ලලිත් එල්ලාවල මහතා

ගරු ගෝවින්දන් කරුණාකරම් මහතා

ගරු ගයන්ත කරුණාතිලක මහතා

ගරු සාගර කාරියවසම් මහතා

ගරු ෆයිසාල් කාසිම් මහතා

ගරු ජයන්ත කැටගොඩ මහතා

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා

ගරු උදයන කිරිඳිගොඩ මහතා

ගරු ලලිත් වර්ණ කුමාර මහතා

ගරු ගෙවිඳු කුමාරතුංග මහතා

ගරු ගීතා සමන්මලී කුමාරසිංහ මහත්මිය

ගරු කරුණාදාස කොඩිතුවක්කු මහතා

ගරු මනෝ ගනේෂන් මහතා

ගරු ඩයනා ගමගේ මහත්මිය

ගරු (වෛද්‍ය) උපුල් ගලප්පත්ති මහතා

ගරු උදයකාන්ත ගුණතිලක මහතා

ගරු කෝකිලා ගුණවර්ධන මහත්මිය

ගරු යදාමිණී ගුණවර්ධන මහතා

ගරු (ආචාර්ය) නාලක ගොඩහේවා මහතා

ගරු එස්. එම්. චන්ද්‍රසේන මහතා

ගරු සිසිර ජයකොඩි මහතා

ගරු මිලාන් ජයතිලක මහතා

ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා

ගරු පියංකර ජයරත්න මහතා

ගරු (වෛද්‍ය) කවින්ද හේෂාන් ජයවර්ධන මහතා

ගරු එම්. එස්. තවුෆික් මහතා

ගරු කුලසිංහම් තිලීපන් මහතා

ගරු ජනක බණ්ඩාර තෙන්නකෝන් මහතා

ගරු ප්‍රමිත බණ්ඩාර තෙන්නකෝන් මහතා

ගරු චාමර සම්පත් දසනායක මහතා

ගරු මොහාන් ප්‍රියදර්ශන ද සිල්වා මහතා

ගරු ෂාන් විජයලාල් ද සිල්වා මහතා

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා

ගරු අනුර දිසානායක මහතා

ගරු දුමින්ද දිසානායක මහතා

ගරු එස්. බී. දිසානායක මහතා

ගරු මයන්ත දිසානායක මහතා

ගරු රෝහණ දිසානායක මහතා

ගරු සාරතී දුෂ්මන්ත මහතා

ගරු ප්‍රේම්නාත් සී. දොලවත්ත මහතා

ගරු (වෛද්‍ය) ගයාෂාන් නවනන්ද මහතා

ගරු වාසුදේව නානායක්කාර මහතා

ගරු චාල්ස් නිර්මලනාදන් මහතා

ගරු සනත් නිශාන්ත මහතා

ගරු කිංස් නෙල්සන් මහතා

ගරු සු. නෝගරාදලිංගම් මහතා

ගරු බුද්ධික පතිරණ මහතා

ගරු අනුප පස්කුවල් මහතා

ගරු නිමල් පියතිස්ස මහතා

ගරු ජගත් පුෂ්පකුමාර මහතා

ගරු ඩිලාන් පෙරේරා මහතා

ගරු කේ. සුජිත් සංජය පෙරේරා මහතා

ගරු ජී. ජී. පොන්නම්බලම් මහතා

ගරු අරුන්දික ප්‍රනාන්දු මහතා

ගරු ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා

ගරු (වෛද්‍ය) සුදර්ශිනී ප්‍රනාන්දුපුල්ලේ මහත්මිය

ගරු අශෝක ප්‍රියන්ත මහතා

ගරු මුදිතා ප්‍රිශාන්ති මහත්මිය

ගරු සජිත් ප්‍රේමදාස මහතා, පාර්ලිමේන්තුවේ විරුද්ධ පාර්ශ්වයේ නායකතුමා

ගරු රෝහණ බංඩාර මහතා

ගරු ආර්. එම්. රංජිත් මද්දුම බණ්ඩාර මහතා

ගරු ශාන්ත බණ්ඩාර මහතා

ගරු රිසාඩ් බදියුදීන් මහතා

ගරු තාරක බාලසූරිය මහතා

ගරු විජිත බේරුගොඩ මහතා

ගරු සුදත් මංජුල මහතා

ගරු කේ. කාදර් මස්තාන් මහතා

ගරු ඉම්රාන් මහරූෆ් මහතා

ගරු ඉම්තියාස් බාකීර් මාකාර් මහතා

ගරු එස්. එම්. එම්. මුෂාරෆ් මහතා

ගරු මොහමඩ් මුසම්මිල් මහතා

ගරු අනුර ප්‍රියදර්ශන යාපා මහතා

ගරු වසන්ත යාපාබණ්ඩාර මහතා

ගරු පාඨලී චම්පික රණවක මහතා

ගරු නිපුණ රණවක මහතා

ගරු (පූජ්‍ය) අතුරලියේ රතන හිමි

ගරු බී. වයි. ජී. රත්නසේකර මහතා

ගරු කුමාරසිරි රත්නායක මහතා

ගරු සී. බී. රත්නායක මහතා

ගරු අලි සබ්රි රහීම් මහතා

ගරු ඉෂාක් රහුමාන් මහතා

ගරු මුජිබුර් රහුමාන් මහතා

ගරු (ආචාර්ය) සුරේන් රාඝවන් මහතා

ගරු ගුණතිලක රාජපක්ෂ මහතා

ගරු මහින්ද රාජපක්ෂ මහතා

ගරු උපුල් මහේන්ද්‍ර රාජපක්ෂ මහතා

ගරු එම්. රාමේෂ්වරන් මහතා

ගරු ෂානක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා

ගරු වරුණ ලියනගේ මහතා

ගරු ජානක වක්කුඹුර මහතා

ගරු ගාමිණී වලේබොඩ මහතා

ගරු ඉරාන් වික්‍රමරත්න මහතා

ගරු රාජිකා වික්‍රමසිංහ මහත්මිය

ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය

ගරු චමින්ද විජේසිරි මහතා

ගරු එම්. ඩබ්ලිව්. ඩී. සහන් ප්‍රදීප් විතාන මහතා

ගරු මධුර විතානගේ මහතා

ගරු හේෂා විතානගේ මහතා

ගරු තේනුක විදානගමගේ මහතා

ගරු චන්දිම වීරක්කොඩි මහතා

ගරු (ජනාධිපති නීතිඥ) ජයන්ත වීරසිංහ මහතා

ගරු ඩී. වීරසිංහ මහතා

ගරු වීරසුමන වීරසිංහ මහතා

ගරු (ආචාර්ය) සරත් වීරසේකර මහතා

ගරු කුමාර වෙල්ගම මහතා

ගරු ජගත් සමරවික්‍රම මහතා

ගරු ජයන්ත සමරවීර මහතා

ගරු රංජිත් සියඹලාපිටිය මහතා

ගරු මෛත්‍රීපාල සිරිසේන මහතා

ගරු ජගත් කුමාර සුමිත්‍රාආරච්චි මහතා

ගරු වඩිවේල් සුරේෂ් මහතා

ගරු ජෝන් සෙනෙවිරත්න මහතා

ගරු රවුෆ් හකීම් මහතා

ගරු එච්. එම්. එම්. හරීස් මහතා

**ගරු අබ්දුල් හලීම් මහතා**

**ගරු ඉන්දික අනුරුද්ධ හේරත් මහතා**

**ගරු කනක හේරත් මහතා**

**ගරු (මහාචාර්ය) චරිත හේරත් මහතා**

**ගරු ඩී. බී. හේරත් මහතා**

**ගරු සමන්ප්‍රිය හේරත් මහතා**

**ගරු මර්ජාන් ෆලීල් මහතා**

**ගරු ෆීල්ඩ් මාෂල් සරත් ෆොන්සේකා මහතා**

ධම්මික දසනායක මහතා, පාර්ලිමේන්තුවේ මහ ලේකම්

කුෂානි රෝහණදීර මහත්මිය, කාර්ය මණ්ඩල ප්‍රධානී සහ පාර්ලිමේන්තුවේ නියෝජ්‍ය මහ ලේකම්

ටිකිරි කේ. ජයතිලක මහතා, සහකාර මහ ලේකම්

**කල් තැබීම අනුව පාර්ලිමේන්තුව රැස්විය. කථානායකවරයා මූලාසනාරූඪ විය.**

**1. ලිපි ලේඛනාදිය පිළිගැන්වීම:** (1) නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යවරයා විසින් 2021 වර්ෂය සඳහා ශ්‍රී ලංකා නාවික හමුදාවේ වාර්ෂික කාර්ය සාධන වාර්තාව, ඉදිරිපත් කරන ලදී.

එම වාර්තාව, **සභා මේසය** මත තැබිය යුතු යැයි නියෝග කරන ලදී.

(2) වරාය, නාවික හා ගුවන් සේවා අමාත්‍යවරයා විසින් පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව විසින් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලද වාර්තාවේ වරාය, නාවික හා ගුවන් සේවා අමාත්‍යාංශයේ ශ්‍රී ලංකන් ගුවන් සමාගම සම්බන්ධව සඳහන් කරුණු පිළිබඳ පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 120(4) ප්‍රකාරව නිරීක්ෂණ සහ ගනු ලැබූ ක්‍රියාමාර්ග පිළිබඳ වාර්තාව ඉදිරිපත් කර එම වාර්තාව, පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(3) වරාය, නාවික හා ගුවන් සේවා අමාත්‍යවරයා විසින් 2021 වර්ෂය සඳහා ගුවන් සේවා හා අපනයන කලාප සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශයේ කාර්ය සාධන වාර්තාව ඉදිරිපත් කරන ලදී.

එම වාර්තාව, **සභා මේසය** මත තැබිය යුතු යැයි නියෝග කරන ලදී.

**2. පාර්ලිමේන්තුවේ රැස්වීම් (අංක 1):** පාර්ලිමේන්තුවේ සභානායකවරයා ඉදිරිපත් කළ යෝජනාව,— පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 8හි විධිවිධානවල සහ 2022 අගෝස්තු 09 දින පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලද යෝජනාවෙහි කුමක් සඳහන්ව තිබුණ ද, අද දින රැස්වීම් පැවැත්වෙන කාල වේලාව පූ.භා. 10.00 සිට අ.භා. 12.30 දක්වා ද, අ.භා. 1.30 සිට අ.භා. 4.30 දක්වා ද විය යුතු ය. පූ.භා. 10.00ට පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 8(5) ක්‍රියාත්මක විය යුතු ය. අ.භා. 4.30ට කථානායකතුමා ප්‍රශ්නය නොවිමසා පාර්ලිමේන්තුව කල් තැබිය යුතු ය.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

**3.පාර්ලිමේන්තුවේ වැඩකටයුතු (අංක 1):** පාර්ලිමේන්තුවේ සභානායකවරයා ඉදිරිපත් කළ යෝජනාව,— අද දින ආණ්ඩුවේ කටයුතු මුඛ්‍යස්ථානය ගත යුතු ය.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

**4.පාර්ලිමේන්තුවේ වැඩකටයුතු (අංක 2):** පාර්ලිමේන්තුවේ සභානායකවරයා ඉදිරිපත් කළ යෝජනාව,— න්‍යාය පත්‍රයේ ප්‍රධාන කටයුතුවල අංක 1 දරන විෂයය පිළිබඳ වැඩ අද දින රැස්වීමේදී පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 27හි විධිවිධානයන්ගෙන් නිදහස් විය යුතු ය.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

**5.පාර්ලිමේන්තුවේ රැස්වීම් (අංක 2):**පාර්ලිමේන්තුවේ සභානායකවරයා ඉදිරිපත් කළ යෝජනාව,— පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 8හි විධිවිධානවල කුමක් සඳහන්ව තිබුණ ද, 2022 අගෝස්තු 29 සඳුදා, 30 අඟහරුවාදා, 31 බදාදා සහ 2022 සැප්තැම්බර් 01 බ්‍රහස්පතින්දා සහ 02 සිකුරාදා පාර්ලිමේන්තුව රැස්වන දිනයන් විය යුතු ය.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

**6.පාර්ලිමේන්තුවේ රැස්වීම් (අංක 3):** පාර්ලිමේන්තුවේ සභානායකවරයා ඉදිරිපත් කළ යෝජනාව,—පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 8හි විධිවිධානවල කුමක් සඳහන්ව තිබුණ ද, 2022 අගෝස්තු 29 සඳුදා රැස්වීම් පැවැත්වෙන කාල වේලාව පූ. භා. 9.30 සිට අ. භා. 12.30 දක්වා ද, අ. භා. 1.00 සිට අ. භා. 4.30 දක්වා ද විය යුතු ය. පූ.භා. 9.30ට ස්ථාවර නියෝග 8(5) ක්‍රියාත්මක විය යුතු ය. අ.භා. 4.30ට කථානායකතුමා ප්‍රශ්නය නොවිමසා පාර්ලිමේන්තුව කල් තැබිය යුතු ය.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

**7.පාර්ලිමේන්තුවේ රැස්වීම් (අංක 4):** පාර්ලිමේන්තුවේ සභානායකවරයා ඉදිරිපත් කළ යෝජනාව,—පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 8හි විධිවිධානවල සහ 2022 අගෝස්තු 09 දින පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලද යෝජනාවෙහි කුමක් සඳහන්ව තිබුණ ද, 2022 අගෝස්තු 30 අඟහරුවාදා, 31 බදාදා සහ 2022 සැප්තැම්බර් 01 බ්‍රහස්පතින්දා සහ 02 සිකුරාදා දිනයන්හි රැස්වීම් පැවැත්වෙන කාල වේලාව පූ. භා. 9.30 සිට අ. භා. 12.30 දක්වා ද, අ. භා. 1.00 සිට අ. භා. 5.30 දක්වා ද විය යුතු ය. අ.භා. 4.30ට ස්ථාවර නියෝග 8(5) ක්‍රියාත්මක විය යුතු ය. අ. භා. 5.30 ට කථානායකතුමා ප්‍රශ්නය නොවිමසා පාර්ලිමේන්තුව කල් තැබිය යුතු ය.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

**8.පාර්ලිමේන්තුවේ රැස්වීම් (අංක 5):** පාර්ලිමේන්තුවේ සභානායකවරයා ඉදිරිපත් කළ යෝජනාව,—පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 8හි විධිවිධානවල සහ 2022 අගෝස්තු 09 දින පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලද යෝජනාවෙහි කුමක් සඳහන්ව තිබුණද, නවවැනි පාර්ලිමේන්තුවේ තෙවැනි සභාවාරයේ පාර්ලිමේන්තුවේ රැස්වීම් පැවැත්වෙන කාල වේලාව 2022 සැප්තැම්බර් 06 දින සිට අඟහරුවාදා, බදාදා, බ්‍රහස්පතින්දා සහ සිකුරාදා දිනයන්හි පූ.භා. 9.30 සිට අ.භා. 12.30 දක්වා ද, අ.භා. 1.00 සිට අ.භා. 5.30 දක්වා ද විය යුතු ය. අ.භා. 4.30ට පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 8(5) ක්‍රියාත්මක විය යුතු ය. අ.භා. 5.30ට කථානායකතුමා ප්‍රශ්නය නොවිමසා පාර්ලිමේන්තුව කල් තැබිය යුතු ය.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

**9.පාර්ලිමේන්තුවේ රැස්වීම් (අංක 6):** පාර්ලිමේන්තුවේ සභානායකවරයා ඉදිරිපත් කළ යෝජනාව,—අද දින විසිර යෑමේදී මෙම පාර්ලිමේන්තුව 2022 අගෝස්තු 29 සඳුදා පූ.භා. 9.30 වන තෙක් කල් තැබිය යුතු ය.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

**10.පනත් කෙටුම්පතක් ඉදිරිපත් කිරීමේ අවසරය (අංක 1) :** ගරු කුමාර වෙල්ගම මහතා, ගරු ප්‍රේම්නාත් සී. දොලවත්ත මහතා ස්ථිර කරනු ලබමින් ඉදිරිපත් කළ යෝජනාව,— පහත සඳහන් පනත් කෙටුම්පත ඉදිරිපත් කිරීමට අවසර දිය යුතුය:—

"රයිගම්පුර ප්‍රජා සංවර්ධන පදනම සංස්ථාගත කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි."

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

ඒ අනුව, පනත් කෙටුම්පත පළමුවර කියවා මුද්‍රණය කිරීමට නියෝග කරන ලදී.

පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 52 (6) අනුව වාර්තා කිරීම සඳහා පනත් කෙටුම්පත කාන්තා , ළමා කටයුතු සහ සමාජ සංවර්ධන අමාත්‍යවරයා වෙත යොමු කරන ලදී.

**11.පනත් කෙටුම්පතක් ඉදිරිපත් කිරීමේ අවසරය (අංක 2) :** ගරු ප්‍රේම්නාත් සී. දොලවත්ත මහතා, ගරු ජගත් සමරවික්‍රම මහතා ස්ථිර කරනු ලබමින් ඉදිරිපත් කළ යෝජනාව,— පහත සඳහන් පනත් කෙටුම්පත ඉදිරිපත් කිරීමට අවසර දිය යුතුය:—

"සියනෑ කතිකාව නාලක ගොඩහේවා පදනම සංස්ථාගත කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි."

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

ඒ අනුව, පනත් කෙටුම්පත පළමුවර කියවා මුද්‍රණය කිරීමට නියෝග කරන ලදී.

පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 52 (6) අනුව වාර්තා කිරීම සඳහා පනත් කෙටුම්පත අධ්‍යාපන අමාත්‍යවරයා වෙත යොමු කරන ලදී.

**12.පනත් කෙටුම්පතක් ඉදිරිපත් කිරීමේ අවසරය (අංක 3) :** ගරු මධුර විතානගේ මහතා, ගරු ප්‍රේම්නාත් සී. දොලවත්ත මහතා ස්ථිර කරනු ලබමින් ඉදිරිපත් කළ යෝජනාව,— පහත සඳහන් පනත් කෙටුම්පත ඉදිරිපත් කිරීමට අවසර දිය යුතුය:—

"2000 අංක 21 දරන ශ්‍රී ලංකා බඳුකරණ කාර්යායතනය (සංස්ථාගත කිරීමේ) පනත සංශෝධනය කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි."

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

ඒ අනුව, පනත් කෙටුම්පත පළමුවර කියවා මුද්‍රණය කිරීමට නියෝග කරන ලදී.

පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 52 (6) අනුව වාර්තා කිරීම සඳහා පනත් කෙටුම්පත මුදල්, ආර්ථික ස්ථායීකරණ හා ජාතික ප්‍රතිපත්ති අමාත්‍යවරයා වෙත යොමු කරන ලදී.

**13.අත්‍යවශ්‍ය මහජන සේවා පනත යටතේ යෝජනා සම්මතය:** අග්‍රාමාත්‍ය සහ රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යවරයා වෙනුවෙන් අධ්‍යාපන අමාත්‍යවරයා ඉදිරිපත් කළ යෝජනාව,— 1979 අංක 61 දරන අත්‍යවශ්‍ය මහජන සේවා පනතේ 2 වගන්තිය ප්‍රකාරව ජනාධිපතිවරයා වෙත පැවරී ඇති බලතල අනුව, 2022 අගෝස්තු 03 දිනැති අංක 2291/26 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ හා එහි උපලේඛනයෙහි පළ කරනු ලැබ, 2022.08.09 දින ඉදිරිපත් කරන ලද ප්‍රකාශනය අනුමත කළ යුතු ය.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

**14. කල් තැබීම (නවවැනි පාර්ලිමේන්තුවේ තෙවැනි සැසිවාරය විවෘත කරමින් ගරු ජනාධිපතිතුමා ඉදිරිපත් කළ ප්‍රතිපත්ති ප්‍රකාශනය) :** "මෙම පාර්ලිමේන්තුව දැන් කල් තැබිය යුතු ය"යි පාර්ලිමේන්තුවේ සභානායකවරයා විසින් යෝජනා කරන ලදී.

කල්තබන ලද විවාදය තවදුරටත් පවත්වනු පිණිස නියෝගය කියවන ලදී. ඊට අදාළ ප්‍රශ්නය (2022 අගෝස්තු 09)

ප්‍රශ්නය යළිත් සභාභිමුඛ කරන ලදින්, විවාදය තවදුරටත් පවත්වන ලදී.

(පූ.භා.11.20 ට නියෝජ්‍ය කථානායකවරයා මූලාසනාරූඪ විය.)

"ගරු (ආචාර්ය) සුරේන් රාඝවන් මහතා මූලාසනාරූඪ විය යුතු ය"යි ගරු ඩිලාන් පෙරේරා මහතා, ගරු එස්.එම්.චන්ද්‍රසේන මහතා ස්ථිර කරමින් යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(අ.භා. 12.45 ට ගරු (ආචාර්ය) සුරේන් රාඝවන් මහතා මූලාසනාරූඪ විය)

"ගරු මයන්ත දිසානායක මහතා මූලාසනාරූඪ විය යුතු ය"යි ගරු මොහාන් ප්‍රියදර්ශන ද සිල්වා මහතා, ගරු රාජිකා වික්‍රමසිංහ මහත්මිය ස්ථිර කරමින් යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(අ.භා. 3.42 ට ගරු මයන්ත දිසානායක මහතා මූලාසනාරූඪ විය.)

"ගරු ශාන්ත බණ්ඩාර මහතා මූලාසනාරූඪ විය යුතු ය"යි ගරු (ආචාර්ය) සුරේන් රාඝවන් මහතා, ගරු සනත් නිශාන්ත මහතා ස්ථිර කරමින් යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(අ.භා. 4.30 ට ගරු මයන්ත දිසානායක මහතා මූලාසනාරූඪ විය.)

එකල්හි වේලාව අ.භා. 4.30 පසු කර තිබූයෙන් අ.භා. 5.37 ට අද දින සභා සම්මතිය අනුව මූලාසනාරූඪ මන්ත්‍රීවරයා විසින් ප්‍රශ්නය නොවිමසා පාර්ලිමේන්තුව කල් තබන ලදී.

පාර්ලිමේන්තුව ඊට අනුකූලව, අද දින සභා සම්මතිය අනුව, 2022 අගෝස්තු 29 සඳුදා පූ.භා. 9.30 වනතෙක් කල් ගියේ ය.